සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**15 | S | I, II**

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2024(2025)**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2024(2025)**
**General Certificate of Education (Ord. Level) Examination, 2024(2025)**

**ක්‍රිස්තියානි ධර්මය I, II**
கிறிஸ்தவம் I, II
Christianity I, II

*පැය තුනයි*
*மூன்று மணித்தியாலம்*
*Three hours*

**අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි**
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

## ක්‍රිස්තියානි ධර්මය I

**උපදෙස්:**

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.
* **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**
* එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

**1.** "දියඹට ගොස් දැල් හෙලන්න." කියා ජේසුස් වහන්සේ පැවසුවේ,
(1) සීමොන් පේදුරුට ය. (2) අන්ද්‍රෑට ය.
(3) ජාකොබ්ට ය. (4) ජොහන්ට ය.

**2.** "සමිඳාණන් වහන්ස මේ පාපය ඔවුන් පිට නොතැබුව මැනව." කියමින් යාච්ඤා කළේ කවුරුන් ද?
(1) පේදුරුතුමන් (2) ස්තේපන්තුමන්
(3) පාවුලුතුමන් (4) ජාකොබ්තුමන්

**3.** දෙවන ධර්මදූත චාරිකාවට පාවුල් සමග එක් වූ අය වන්නේ,
(1) බාර්ණබස්, ජොහන් මාක් සහ ලූක් ය. (2) බාර්ණබස්, සීලස් සහ ලූක් ය.
(3) සීලස්, තිමෝතියස් සහ ලූක් ය. (4) අරිස්තාර්කස්, සීලස් සහ ලූක් ය.

**4.** ක්‍රිස්තුස් වහන්සේගේ නාමය වෙනුවෙන් ඔහුට දුක් විඳීමට සිදුවන බව ප්‍රකාශ කළේ කවුරුන් ද?
(1) ජොහාන් මාක් (2) පාවුල්තුමන්
(3) බාර්ණබස්තුමන් (4) කොර්නේලියස්

**5.** පෙන්තකොස්ත දින ප්‍රථම දේශනය කරන ලද්දේ කවුරුන් ද?
(1) ශුද්ධ ජොහන්තුමන් (2) ශුද්ධ මතෙව්තුමන්
(3) ශුද්ධ පේදුරුතුමන් (4) ශුද්ධ පාවුල්තුමන්

**6.** දේව මැවිල්ලේ උසස්ම නිර්මාණය ලෙස සලකනු ලබන්නේ කුමක් ද?
(1) ඉර හඳ සහ තාරකා (2) ගස් කොළං හා පරිසරය
(3) සත්ත්වයන්, පක්ෂීන් සහ මත්ස්‍යයන් (4) ආදම් සහ ඒව ලෙස මනුෂ්‍යයින්

**7.** පොළොවෙහි පව් කමා කිරීමේ බලය මනුෂ්‍ය පුත්‍රයාට ඇති බව ජේසුස් වහන්සේ පැවසුවේ,
(1) අංශභාග රෝගියා සුව කළ අවස්ථාවේදී ය.
(2) අතක් පණ නැති රෝගියා සුව කළ අවස්ථාවේදී ය.
(3) ලාදුරු රෝගියා සුව කළ අවස්ථාවේදී ය.
(4) ශතාධිපතියාගේ සේවකයා සුව කළ අවස්ථාවේදී ය.

[දෙවැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka

8. "සතුට හා සොම්නස ඔබට ඇති වේ. මන්ද බොහෝදෙනා ඔහුගේ උත්පත්තිය නිමිත්තෙන් ප්‍රීතිවන්නාහ." මෙය පවසන ලද්දේ කාගේ උපත සම්බන්ධයෙන් ද?
(1) ජේසු බිළිඳාගේ උපත (2) එළිසබෙත්ගේ උපත
(3) ස්නාවක ජොහාන්ගේ උපත (4) සෙකරියස්ගේ උපත

9. සද්දූසිවරුන්ගේ බලයේ කේන්ද්‍රස්ථානය වූයේ,
(1) අති ශුද්ධ ස්ථානය ය. (2) සිනගෝගයන් ය.
(3) රෝම බල ප්‍රදේශයන් ය. (4) ජෙරුසලමේ දේවමාළිගාව ය.

10. ජේසුස් වහන්සේගේ ශරීරය සොහොන්ගත කිරීමට බාරගත් තැනැත්තා/තැනැත්තන් වූයේ,
(1) සිරේනියේ සීමොන් ය. (2) ආරිමාතියේ ජෝසෙප් ය.
(3) මාර්තා සහ මරියා ය. (4) සුසානා සහ මග්දලායේ මරියා ය.

11. සිනගෝගයන්හි සිදු කළ ප්‍රධාන කාර්යය වනුයේ,
(1) සමාජ සත්කාර සේවාවන් කිරීම ය. (2) එම ප්‍රදේශයේ නඩු විසඳීම ය.
(3) යුදෙව්වරුන්ට ආගමික දැනුම ලබාදීම ය. (4) වෘත්තීය පුහුණු ලබාදීම ය.

12. ජේසුස් වහන්සේගේ උත්ථානයෙන් පසු එම්මාවුස් ගමට ගිය ගෝලයින් සංඛ්‍යාව කොපමණ ද?
(1) 2 කි. (2) 3 කි. (3) 12 කි. (4) 70 කි.

13. "පල්ලියේ ගොඩනැගිල්ල ජනතාව සඳහා ය." යන උදාර ප්‍රකාශය කළ පූජකතුමා වන්නේ,
(1) මයිකල් රොද්‍රිගෝ පියතුමා ය.
(2) තිස්ස බාලසූරිය පියතුමා ය.
(3) පීටර් ජෙරාඩ් පියතුමා ය.
(4) චන්ද්‍රා ප්‍රනාන්දු පියතුමා ය.

14. "ධනවත් වූ ඔබට වන විපතක මහත ..." යන ප්‍රකාශය නිවැරදිව සම්පූර්ණ කිරීම සඳහා අවශ්‍ය වැකි කොටස තෝරන්න.
(1) "ඔබ හඬා වැළපෙනු ඇත." (2) "ඔබට සාගිනි වනු ඇත."
(3) "ඔබේ සැපවත් ජීවිතය විඳ හමාරය." (4) "ඔබ ප්‍රීති ප්‍රමෝද වනු ඇත."

15. පාවුල්තුමාව දේවත්වයෙන් සැලකූ ස්ථානය වන්නේ,
(1) මෝල්ටාව ය. (2) ඇතන්ස් ය. (3) එපීසය ය. (4) කොරින්තිය ය.

16. දෙවියන් වහන්සේට නොකඩවා යාච්ඤා කළ කායිසාරියේ සිටි රෝම ශතාධිපතියා වන්නේ,
(1) නිකදේමුස් ය. (2) කොර්නේලියස් ය.
(3) අනනියස් ය. (4) ජායිරස් ය.

17. ජේසුස් වහන්සේගේ හා ස්නාවක ජොහන්තුමාගේ උපත් තුළ ඇති පොදු ලක්ෂණය වන්නේ,
(1) මෙම උපත් පිළිබඳ දේවදූතයා විසින් දැන්වීමයි.
(2) පෙරදිග සිට ශාස්ත්‍රවන්තයන්ගේ පැමිණීමයි.
(3) හෙරෝද් රජු කලබලයට පත්වීමයි.
(4) ඉහළ අහසේ තාරකාවක් පැයීමයි.

18. පහත ලක්ෂණ සලකන්න.
A - තම බලයෙන් ක්‍රියා කරයි.
B - දුක් පීඩාවට ලක්වූවන් තවත් පීඩාවට ලක් නොකරයි.
C - දුක්පීඩා නොවන ලෙස යාච්ඤා කරයි.
D - සැරපරුෂ ගති නොමැතිව මෘදුබවින් ක්‍රියා කරයි.

ඉහත ලක්ෂණ අතුරෙන් යෙසායා දිවැසිවරයා සඳහන් කරන පරිදි දුක් විඳින සේවකයාණන් සතු ලක්ෂණ යුගලය වන්නේ කුමක් ද?
(1) A හා B (2) B හා C (3) B හා D (4) C හා D



Department of Examinations Sri Lanka

19. පාවුල් (සාවුල්) දමස්කය බලා ගමන් ගත්තේ,
(1) අනනියස් හමුවීමට ය.
(2) කිතුනුවන් අත්අඩංගුවට ගෙන පීඩා කිරීමට ය.
(3) ජුදා ආගම ප්‍රචලිත කිරීමට ය.
(4) රෝම ආණ්ඩුකාරවරයාගේ අණ ක්‍රියාත්මක කිරීමට ය.

20. මරියතුමිය සහ ජෝසෙප්ගේ ජීවිත ඇසුරින් වර්තමානයේ අපගේ ජීවිතවලට ලබාගත හැකි වන්නේ,
(1) තෝරාගැනීම පිළිබඳ උදම් ඇනීමයි.
(2) තෝරාගැනීම පිළිබඳව ආඩම්බරවීමයි.
(3) දේව අණට අවනත වීමයි.
(4) ජුදා සමාජයේ තහංචි පිළිබඳ සොයා බැලීමයි.

21. ජෝබ් හා ජෙරමියා අතර වූ පොදු ලක්ෂණය කුමක් ද?
(1) දේව කැමැත්ත හමුවේ දුකින් බලාසිටීම
(2) සියලු දුක් කරදර හමුවේ දිරියෙන් හා ඇදහිල්ලෙන් මුහුණදීම
(3) දුක් කරදර මධ්‍යයේ මැසිවිලි නගමින් ජීවත්වීම
(4) සියලු සැප සම්පත් අහිමිවීම තුළ දුක්ඛිතව ජීවත්වීම

22. පේදුරුගේ අපලාපය, කිතුනුවන්ට මුහුණදීමට සිදුවන්නේ කුමන අවස්ථාවක ද?
(1) සත්‍ය වෙනුවෙන් සියලුදෙනාම පෙනී සිටින අවස්ථාවක
(2) සත්‍ය වෙනුවෙන් එක් අයෙකුට තනිවම පෙනී සිටීමට සිදුවන අවස්ථාවක
(3) සත්‍ය වෙනුවෙන් අයෙකු යාච්ඤාවට පමණක් යොමුවන අවස්ථාවක
(4) සත්‍ය මගහරවා ගන්නට අයෙකු මිතුරන් සමග සාකච්ඡාවේ යෙදෙන අවස්ථාවක

23. "සබත මිනිසා උදෙසා මිස, මිනිසා සබත උදෙසා නොවන බව." යන ඉගැන්වීමෙන් අප වෙත ගෙන ආ පණිවුඩය වන්නේ,
(1) සබත් දින පවා මනුෂ්‍යත්වයට ගරු කළ යුතු බවයි.
(2) සබත් දින ශුද්ධ කොට පැවැත්වීම තුළ කිසිවකු වැඩ නොකර සිටිය යුතු බවයි.
(3) සබත් දින වැඩ කිරීම ව්‍යවස්ථාව කඩ කිරීමක් වන බවයි.
(4) සබත් දින වැඩ කිරීම ආඥා දසය කඩ කිරීමක් වන බවයි.

24. "කමත හොඳ හැටි පිරිසිදු කරන පිණිසත්, ධාන්‍ය පොලා සිය අටුවේ රැස්කරන පිණිසත් උන්වහන්සේගේ අතේ කුල්ල ඇත." යන ප්‍රකාශය මගින් අප ජීවිතයට ලැබෙන පණිවුඩය කුමක් ද?
(1) ධාන්‍ය පොලා බොල් ඉවත් කරන බවයි.
(2) මිනිස් ජීවිතයේ අවසාන තීරණය ජේසුස් වහන්සේ ගනු ලබන බවයි.
(3) මිනිස් ජීවිතයේ ඇති අපිරිසිදු වූ දේ පොලා ඉවත ලා හැකි බවයි.
(4) හොඳ නරක වෙන් කිරීම සඳහා කුල්ල වැදගත් භාණ්ඩයක් වන බවයි.

25. "ජේසුස් වහන්සේ වෛරය නමැති මැද බිත්තිය කඩා දැමූ බව." යන පාඨය අප රටට සම්බන්ධ කොට යොදාගත හැකි වන්නේ කෙසේ ද?
(1) ජාතීන් හා ආගම් අතර සමගිය ඇති කිරීම සඳහා
(2) අන් විශ්වාසයන් ද අප ඇදහිය යුතු බව පෙන්වීම සඳහා
(3) සෑම ආගමක්ම එකක් වන බව පෙන්වීම සඳහා
(4) එක සංස්කෘතියක් පමණක් රට තුළ පැවතිය යුතු බව තහවුරු කිරීම සඳහා

26. ජේසුස් වහන්සේ ඔලීව කන්දෙහි කළ යාච්ඤාව මගින් කිතුනුවන් අවබෝධ කරගත යුතු වන්නේ කුමක් ද?
(1) නිරන්තර යාච්ඤාව පමණක් වැදගත් බව
(2) යාච්ඤාව කිතුනුවන්ට පමණක් මහඟු අවියක් බව
(3) යාච්ඤාව තුළින් දේව කැමැත්තට අවනතවීම වැදගත් බව
(4) ඔලීව කන්ද වැනි පරිසරයක යාච්ඤා කළ යුතු බව

[හතරවැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka

**27.** එකම කුසලානයෙන් පානය කිරීම මගින් ජේසුස් වහන්සේ ස්ථාපනය කළේ උන්වහන්සේගෙන් වැගිරෙන්නා වූ රුධිරයෙන් ඇති කළ

(1) නව ගිවිසුමයි.
(2) රොටි කැඩීමේ පිළිවෙතයි.
(3) ජුදෙව් චාරිත්‍රයක් ඉටු කිරීමයි.
(4) ජුදෙව් පාස්කුවට මග පෑදීමයි.

**28.** අරිමාතියේ ජෝසෙප් ජුදා මන්ත්‍රණ සභාවේ සාමාජිකයකුව සිටිය ද, ජේසුස් වහන්සේගේ මරණ දඬුවම ක්‍රියාත්මක කිරීම අනුමත **නොකළේ,**

(1) ඔහු සත්‍යයට සාක්ෂි දරන්නෙකු වූ නිසා ය.
(2) ජනතාව කැරැල්ලක් ඇති කරතැයි ඔහු බිය වූ නිසා ය.
(3) ඔහු මරණ දඬුවම් අනුමත නොකරන නිසා ය.
(4) ජනතාවගෙන් ප්‍රතික්ෂේප වීමට ඔහු බිය වූ නිසා ය.

**29.** පහත සඳහන් කරුණු සලකන්න.

A - එඬේර ප්‍රේමයෙන් කැපවීම
B - එඬේරු තම අභිමතය තුළ පමණක් ක්‍රියා කිරීම
C - බැටළුවන් ලෙසට ක්‍රියා කිරීම පිළිබඳ අධ්‍යයනය කිරීම
D - නිහතමානී සේවකයෙකු ලෙස සේවය කිරීම

ඉහත කරුණු අතුරෙන්, එඬේර නායකයන් ලෙස අප ක්‍රියා කළ යුතු අන්දම දක්වන වඩාත් ම ගැළපෙන කරුණු යුගල වන්නේ කුමක් ද?

(1) A හා C
(2) A හා D
(3) B හා D
(4) C හා D

**30.** පහත ප්‍රකාශ සලකන්න.

A - ජාතීන් අතර සමගිය කරා ජනතාව බලගැන්වීම
B - කිතුනුවන් අතර පමණක් සමානාත්මතාවය වෙනුවෙන් පෙනී සිටීමට සභාව බලගැන්වීම
C - ධර්මිෂ්ඨකම හා යුක්තිය වෙනුවෙන් නැගී සිටීමට තාරුණ්‍යය බලගැන්වීම
D - අවශ්‍යතාවක් පැන නැගුණ අවස්ථාවල පමණක් රාජ්‍ය ආයතන බලගැන්වීම

ඉහත ප්‍රකාශ අතුරෙන්, මෙසියස් වහන්සේගේ ජීවිත පූජාව නිසා අපට ලැබෙන පරිපූර්ණ ජීවිතය ස්ථාපනය කළ හැකි ආකාරය දක්වෙන ප්‍රකාශ යුගලය ඇතුළත් වරණය කුමක් ද?

(1) A හා B
(2) A හා C
(3) B හා C
(4) C හා D

**31.** ශ්‍රී ලංකාවේ ස්වභාවික ආපදාවන්ට මුහුණ දුන් ජනතාව උදෙසා කිතුනුවන් විසින් සිදුකළ යුතු ප්‍රධාන කාර්යභාරය වන්නේ කුමක් ද?

(1) නව මගක් පිළිබඳ ඔවුනට කියා දීමට උත්සහ දැරීම
(2) ආධාර පමණක් බෙදාදීමෙන් සෑහීමට පත්වීම
(3) රජයේ ආයතන වෙත යොමු කර බලා සිටීම
(4) දයානුකම්පාවෙන් ඔවුන් රැකබලා ගැනීම

**32.** පහත ප්‍රකාශ සලකන්න.

A - අන්‍ය ආගමිකයන් සමග සම්බන්ධව ක්‍රියා කළ යුතුයි.
B - දේව රාජ්‍ය පිළිබඳ නිවැරදි චින්තනයක් දැරිය යුතුයි.
C - ප්‍රේමයෙන් එක්සත් වී කණ්ඩායමක් ලෙස සාක්ෂි දැරිය යුතුයි.
D - 'වගවලසුන්ට' එරෙහිව ක්‍රියා කළ යුතුයි.

ඉහත ප්‍රකාශ අතුරෙන්, ස්ව කැමැත්තෙන් ධර්මදූත මෙහෙවරේ යෙදෙන්නන් පිළිබඳව වන නිවැරදි ප්‍රකාශ යුගලය කුමක් ද?

(1) A හා B
(2) A හා C
(3) B හා C
(4) B හා D

**33.** තෙරේසා මව්තුමියගේ මෙහෙවරින් අපට ගතහැකි පාඩම වන්නේ,

(1) තෝරාගත් ජන කොටසකට පමණක් සේවය කිරීමයි.
(2) තරාතිරම් නොබලා අසරණ අයට සේවය කිරීමයි.
(3) තමන්ට උපකාර කරන්නන්ට සේවය කිරීමයි.
(4) කීර්තිමත් නාමයක් ඇතිකර ගැනීම උදෙසා සේවය කිරීමයි.

[පස්වැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka

**34.** සදාචාර සම්පන්න සමාජයක් ගොඩනැගීම සඳහා වඩාත් සුදුසු ක්‍රමය වන්නේ,
(1) පක්ෂ දේශපාලනය තුළ ක්‍රියාකිරීමයි.
(2) ආගමික සංස්ථාවන් තුළින් සමාජය ගොඩනැගීමයි.
(3) පවුල තුළින් ආරම්භ වී සමාජය ගොඩනැගීමයි.
(4) බුද්ධිමතුන්ගෙන් සමන්විත සමාජයක් ගොඩනැගීමයි.

**35.** මිහිපිට කිතුනු 'ප්‍රේමය' වඩාත් අර්ථවත් වූ අවස්ථාවක් වන්නේ,
(1) විවාහවීමට සිටි තැනැත්තා මියගිය නිසා විවාහ නොවී සිටීමයි.
(2) පුතකු ශල්‍යකර්මයක් සඳහා ඔහුගේ මවට රුධිරය පරිත්‍යාග කිරීමයි.
(3) තම ඉඩම් කොල්ල කෑ පුද්ගලයාට රුධිරය පරිත්‍යාග කිරීමයි.
(4) ළමා නිවාසයක සිටින ළමුන් පිළිබඳ සැලකිලිමත්වීමයි.

**36.** දේව රාජ්‍යයේ ඉගැන්වීමට අනුව අපගේ සමාජය කෙසේ හැඩගැස්විය යුතු ද?
(1) නිශ්චිත කණ්ඩායමක් සඳහා යුක්තිය සහ සමානාත්මතාවය පදනම් කොටගෙන ය.
(2) පාලකයන් ගත් ක්‍රියාමාර්ග රැකගැනීම පදනම් කොටගෙන ය.
(3) ජනතාවගේ අයිතිවාසිකම් සුරැකීම පදනම් කොටගෙන ය.
(4) සියලු මිනිසුන්, සතුන් හා පරිසරය සඳහා සමානාත්මතාවය සහ යුක්තිය පදනම් කොටගෙන ය.

**37.** පහත කරුණු සලකන්න.

A - ජෙරුසලමේ යුද මානසිකත්වයක් ගොඩනැගෙන බවයි.
B - සෞභාග්‍යමත් සහ සාමකාමී ජීවන රටාවක් ගොඩනැගෙන බවයි.
C - ජෙරුසලමේ යුද මානසිකත්වය අවසන්වීමට තිබෙන බවයි.
D - ජෙරුසලම තුළ සාමය අබිබවා වාද, භේද හා වෛරය තිබෙන බවයි.

ඉහත කරුණු අතුරෙන්, "තමන්ගේ කඩුවලින් නගුල් තල ද හෙල්ලවලින් දෑ කැති ද තලා ගනු ලබයි." යන ප්‍රකාශය මගින් මීකා දිවැසිවරයා අනාවරණය කරනු ලබන කරුණු යුගල තෝරන්න.

(1) A හා B (2) A හා C (3) B හා C (4) C හා D

**38.** දේව රාජ්‍යයේ තීරණාත්මක මොහොත වන්නේ,
(1) ජේසු උපත සිදුවීමයි.
(2) ජේසුස් වහන්සේගේ නැවත පැමිණීමයි.
(3) ජේසුස් වහන්සේගේ මරණය සිදුවීමයි.
(4) ජේසුස් වහන්සේගේ උත්ථානය සිදුවීමයි.

**39.** අප සමාජය තුළ ප්‍රේමයෙන් ක්‍රියා කළ යුත්තේ කෙසේ ද?
(1) ධනය රැස්කරමින්, ඉන් සුළු ප්‍රමාණයක් දුගීන් සමග බෙදාගැනීමෙන්
(2) මිත්‍රත්වයන් ශක්තිමත් කරමින් හා ජනප්‍රියතාවය රැකගනිමින්
(3) සානුකම්පිතව ක්‍රියාකරමින් හා සත්‍ය රජකරවමින්
(4) තම කම රැකගනිමින් සහ පවුල පිළිබඳ සැලකිලිමත්වීමෙන්

**40.** ආබ්‍රහම්ගේ ජීවිත ආදර්ශයට අනුව, දෙවි සමිඳුන්ට අප කීකරු විය යුතු වන්නේ,
(1) අපට අයිති සම්පත් රැකගැනීමෙනි.
(2) අප යන ඕනෑම තැනකට නෑදෑ හිතමිතුරන් රැගෙන යාමෙනි.
(3) අප නොදන්නා වූ දුර ප්‍රදේශවලට ගොස් අපටම සේවය කිරීමෙනි.
(4) අපට අයිති සම්පත් පරිත්‍යාග කරමින් දේව අණට කීකරුවීමෙනි.

* *

[හයවැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**15 S I, II**

## අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2024(2025)
## கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2024(2025)
## General Certificate of Education (Ord. Level) Examination, 2024(2025)

| | |
|---|---|
| **ක්‍රිස්තියානි ධර්මය** | **I, II** |
| கிறிஸ்தவம் | **I, II** |
| Christianity | **I, II** |

### ක්‍රිස්තියානි ධර්මය II

* **පළමුවැනි** ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළුව ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.
* පළමුවැනි ප්‍රශ්නයට ලකුණු **20** ක් ද තෝරා ගන්නා අනෙක් ප්‍රශ්නයකට ලකුණු **10** බැගින් ද හිමි වේ.

**1.** (i) (අ) ජේසුස් වහන්සේව කුරුසියේ ඇණගැසීමට තීරණය ලබාදුන්නේ කවුරුන් විසින් ද?

(ආ) ජනතාව ජේසුස් වහන්සේ වෙනුවට නිදහස් කිරීමට තෝරාගත් පුද්ගලයා කවුරුන් ද?

(ii) ජේසුස් වහන්සේ පාවා දුන්නේ කවුරුන් ද? ඒ සඳහා ඔහු උපයෝගී කරගත් ක්‍රමවේදය කුමක් ද?

(iii) (අ) දෙවියන් වහන්සේ උදාර වූ සිංහාසනයක් මත වැඩ සිටින බව දර්ශනයකින් දුටු දිවැසිවරයා කවුරුන් ද?

(ආ) එම දිවැසිවරයා තම කැඳවීමට මුලින්ම දක්වූ ප්‍රතිචාර අතුරෙන් **එකක්** සඳහන් කරන්න.

(iv) ලාසරස් හා ධනවතාගේ ජීවන තත්ත්වයන් පෙන්නුම් කරන කරුණු **එක** බැගින් වෙන වෙන ම ලියන්න.

(v) (අ) ත්‍රෝවසයේදී සිදු වූ ප්‍රාතිහාර්යය කුමක් ද?

(ආ) එම ප්‍රාතිහාර්යය සිදු කරන ලද්දේ කවුරුන් විසින් ද?

(vi) "මුළු ඉශ්රායෙල් ජනතාව අතරවත් මෙතරම් ශ්‍රද්ධාවක් මා දැක නැත."

(අ) ජේසුස් වහන්සේ මෙසේ පැවසුවේ කවර පුද්ගලයෙකු පිළිබඳව ද?

(ආ) මෙමගින් දේව රාජ්‍යයේ කුමන ගුණාංගයක් ඉස්මතු කෙරේ ද?

(vii) මුල් කිතුනු සභාවේ 'සහභාගිකම' පෙන්නුම් කරන ලක්ෂණ **දෙකක්** ලියන්න.

(viii) තම කිතුනුකම රැකගෙන සමාජය තුළ සහජීවනය ඇතිකළ හැකි ආකාර **දෙකක්** සඳහන් කරන්න.

(ix) (අ) 'නාඳුනන දෙවියන්ට' යන පූජාසනය, පාවුල්තුමාට දැනගන්නට ලැබුණු නගරය කුමක් ද?

(ආ) එම නගරයේ වැසියන් ආමන්ත්‍රණය කිරීමට පාවුල්තුමා උපයෝගී කරගත් ක්‍රමෝපායවලින් **එකක්** සඳහන් කරන්න.

(x) වර්ණභේදවාදයට එරෙහිව ජීවිතය පරදුවට තබමින් සේවය කළ නායකයන් **දෙදෙනෙකු** සඳහන් කරන්න.

**2.** (i) (අ) සීසර් අධිරාජ්‍යයාට බදු ගෙවීම පිළිබඳ ප්‍රශ්නය නැගුවේ කවුරුන් ද?

(ආ) එයට ප්‍රතිචාර දැක්වීමට උපයෝගී කරගත් කාසිය කුමක් ද?

(ii) ජේසුස් වහන්සේව විටින් විට විවේචනයට හා අභියෝගයට ලක් කළ යුදෙව් ආගමික කණ්ඩායම් **තුනක්** සඳහන් කරන්න.

(iii) "සීසර්ගේ දේ සීසර්ටත් දෙවියන් වහන්සේගේ දේ දෙවියන් වහන්සේටත් දෙන්න." යන ප්‍රකාශය තුළින් වත්මන් කිතුනු සමාජයට ලබාදිය හැකි ආදර්ශ **පහක්** ලියා, ඉන් **එකක්** ක්‍රියාවට නැංවිය හැකි ආකාරය කෙටියෙන් විස්තර කරන්න.

[හත්වැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka

**3.** (i) ආත්මයාණන් වහන්සේගේ මගපෙන්වීම යටතේ ජීවත්වන පුද්ගලයෙකු ලෙස ඔබ විදහා දක්වන හැසිරීම් රටා **දෙකක්** සඳහන් කරන්න.

(ii) ආත්මයාණන් වහන්සේගේ මගපෙන්වීමෙන් බැහැරව කටයුතු කරන අයගේ ජීවිත තුළ දක්නට ලැබෙන ලක්ෂණ **තුනක්** ලියන්න.

(iii) ඔබගේ මිතුරන් වර්තමාන සමාජය තුළ මුහුණ දෙන අභියෝග **පහක්** සඳහන් කොට, ඉන් **එක්** අභියෝගයකින් මිදීම සඳහා ඔබට උපකාර කළ හැකි ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න.

**4.** (i) (අ) මිසරයේ වහල්බවින් පීඩා විඳි සෙනඟ මොරගැසුවේ කාට ද?

(ආ) ඔවුන්ව වහල්බවින් මුදවා ගැනීම පිණිස යැව්වේ කවුරුන් ද?

(ii) ඉශ්රායෙල් ජනයා මිසරයේදී පීඩා විඳීමට හේතු වූ කරුණු **තුනක්** ලියන්න.

(iii) වර්තමාන සමාජය තුළ අපට දකින්නට හා අසන්නට ලැබෙන හිංසන හා පීඩිත තත්ත්වයන් **පහක්** සඳහන් කොට, ඉන් **එකකට** ඔබ යෝජනා කරන පිළියම් කවරේ දැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

**5.** (i) ආමොස් දිවැසිවර සේවයේ යෙදෙන්නට පෙර ඔහු යෙදී සිටි වෘත්තීන් **දෙකක්** ලියා දක්වන්න.

(ii) ආමොස් ජීවත් වූ සමාජය තුළ පැවති අසාධාරණ අයුක්ති සහගත ක්‍රියාකාරකම් **තුනක්** සඳහන් කරන්න.

(iii) අද සමාජය තුළ මෙවැනි අසාධාරණකම් හමුවේ, කිතුනු අපට ගතහැකි ක්‍රියාමාර්ග **පහක්** කෙටියෙන් විස්තර කරන්න.

**6.** (i) සාවුල් (පාවුල්) හා බාර්ණබස් උපන් නගර වෙන් වෙන් ව ලියන්න.

(ii) (අ) බාර්ණබස් සිරියාවේ අන්තියෝකියේ සභාවට පැමිණි විට එම සභාවේ වර්ධනය කෙබඳු වී තිබුණි ද?

(ආ) අන්තියෝකි සභාවේ වර්ධනය හමුවේ බාර්ණබස් දැක් වූ ප්‍රතිචාරය කුමක් ද?

(ඉ) සාවුල් සහ බාර්ණබස් ධර්මදූත සේවයට පිටත්කර යැවීමට ප්‍රථම ඔවුන්ට ශක්තිය ලබාදුන්නේ කෙසේ ද?

(iii) පළමු ධර්මදූත මෙහෙවර මුල්කරගෙන, වර්තමාන සමාජය තුළ කෙරෙන මෙහෙවරයන්හිදී කිතුනු අපට අනුගමනය කළ හැකි ධනාත්මක උපක්‍රම **පහක්** උදාහරණ දෙමින් කෙටියෙන් විස්තර කරන්න.

**7.** පහත සඳහන් මාතෘකා අතුරෙන් **දෙකක්** තෝරා ගෙන ඒ සඳහා දී ඇති උපදෙස් වාක්‍ය භාවිත කරමින් කෙටි සටහන් ලියන්න.

(i) විනිශ්චය හා කුරුසියේ මරණය

- ජේසුස් වහන්සේට එල්ල වූ චෝදනා
- ජේසුස් වහන්සේව විනිශ්චය කළ පුද්ගලයන් හා කණ්ඩායම්
- ජේසුස් වහන්සේගේ දුක්විඳීම හා මරණය සිදු වූ ආකාරය
- ජේසුස් වහන්සේ විනිශ්චයේදී කළ ප්‍රකාශන හා කුරුසිය වටා සිටි අයවලුන් ජේසුස් වහන්සේ වෙත යොමු කළ කියමන්
- සාධාරණ විනිශ්චයක් හා යහපත් මරණයක් බලාපොරොත්තුවීම

(ii) දිවැස් වැකි

- දිවැස් වැකි යනු
- කිතු උපත පිළිබඳ දිවැස් වැකි
- ඒවායේ දක්නට ලැබෙන විශේෂ ගුණාංග
- කිතුනු උපත සිදු වූ කාලය තුළ දක්නට ලැබෙන සමාජ තත්ත්වය
- වර්තමාන සමාජයේ දිවැසිවර කාර්යය හඳුනාගැනීම

[අටවැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka

(iii) සමාවදීම

- ජේසුස් වහන්සේ සමාවදීම සම්බන්ධයෙන් ඉගැන්වූ අවස්ථාවන්
- සමාවදීම පිළිබඳ ජේසුස් වහන්සේගේ විශේෂ පණිවුඩය
- සමාවදීම යන්න ඉගැන්වීමක් පමණක් නොව, ජේසුස් වහන්සේගේ ක්‍රියාවන් තුළින් ද දැකිය හැකි වූවකි.
- සමාවදීමෙන් ජේසුස් වහන්සේ පෙන්නුම් කළ දෙවියන් වහන්සේ පිළිබඳ පණිවුඩය
- සමාවදීමේ වැදගත්කම හා එය ජීවිත ආදර්ශයෙන් පෙන්නුම් කළ කිතුනුවන්

(iv) ලෞකික හා ආත්මික දිළිඳුකම

- ජේසුස් වහන්සේ ජීවත් වූ සමාජයේ දක්නට තිබූ සමාජ තරාතිරම්
- ධනවත් පුද්ගලයින් හා ධනය පිළිබඳ ජේසුස් වහන්සේගේ ඉගැන්වීම්
- දේව රාජ්‍යයට ධනය බාධාවක් වන්නේ ය.
- දේව රාජ්‍යය හා අප අතර බාධක ඇත්නම් ජේසුස් වහන්සේට අනුව විවිධ ක්‍රියාමාර්ග ගත යුතු ය.
- වර්තමානයේ දිළිඳුකම අවබෝධ කරගැනීම හා අවශ්‍ය ලෙස එයට ප්‍රතිචාර දැක්වීම

***

Department of Examinations Sri Lanka